විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය | தலைமுறையொன்றின் பெருமிதம் | Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 12/2020..........
ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................
දිනය / திகதி / Date } 2020.12.21

විදේශ දූත මණ්ඩල කාර්යාල ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**2021 වර්ෂය සඳහා විදේශයන්හි වසර දෙකකට වඩා වාසය කරන ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින්ගේ වාර්ෂික ජීවිත සහතික ලබා දීම,**

2018.06.20 දිනැති අංක 01/2018 දරණ විශ්‍රාම වැටුප් චක්‍රලේඛයෙහි අංක 21 සිට 32 වන වගන්ති කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරනු කැමැත්තෙමි.

02. ඉහත චක්‍රලේඛයෙහි 21 වගන්තිය ප්‍රකාරව 2021 වර්ෂය සඳහා ජීවිත සහතික ලබා දීම 2020.12.01 දින සිට 2021.03.31 දක්වා වන කාලය තුළ සිදු කරනු ලැබේ. 2020.03.31 දිනට ජීවිත සහතික ලබා දී නොමැති විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම ඉහත චක්‍රලේඛයෙහි 29 වන වගන්තියෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව 2021 මැයි මාසයේ සිට නතර කරනු ඇත.

03. ජීවිත සහතික ආකෘති පත්‍රය www.pensions.gov.lk දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ Foreign Pensions යටතේ ස්ථාපනය කර ඇති අතර විශ්‍රාමිකයා එය බාගත (download) කරගෙන ඉහත චක්‍රලේඛයෙහි සඳහන් Iවිධිවිධාන වලට අනුකූලව සම්පූර්ණ කළ යුතුය.

04. තවද, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2018 හි 27 වගන්තිය අනුව දූත මණ්ඩල වලට සහතික කිරීමට යොමු කල ජීවිත සහතික නිසි පරිදි සහතික කොට, ඒවා පරිලෝකනය (Scan) කර foreignlc@pensions.gov.lk යන විද්‍යුත් ලිපිනයට පරිලෝකනය (Scan) කළ විශ්‍රාමිකයාගේ වලංගු ගුවන් බලපත්‍රයේ පිටපතක් ද සහිතව **කාර්යාල විද්‍යුත් ලිපිනයෙන්** අප වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

05. වසර දෙකකට වඩා අඩු කාලයක් සඳහා විදේශගත වී සිටින විශ්‍රාම වැටුප් ලිපිගොනු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පවත්වාගෙන යනු ලබන විශ්‍රාමිකයින්ගේ ජීවිත සහතික විදේශ දූත මණ්ඩල කාර්යාල මගින් සහතික කිරීමෙන් අනතුරුව අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් විසින් එම තොරතුරු දත්ත පද්ධතියෙහි යාවත්කාලීන කරනු ඇත.

06. පවත්නා වසංගත තත්ත්වය තුල දී වුවත් විශ්‍රාම වැටුප් වියදම් කළමනාකරණය සඳහා ඉහත පරිදි තොරතුරු ලබා දීම මගින් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ජේ.ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් - 01. ලේකම් - රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
02. ලේකම් - විදේශ කටයුතු අමාත්‍යාංශය
03. ලේකම් - මුදල් අමාත්‍යාංශය
04. විගණකාධිපති

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk